# GMOA

TU No. 291
ESTABLISHED IN 1926

Tel : 2580886 / 0714 999555
Fax : 2503586 / 4518668
Web : www.gmoa.lk
Email : gmoasrilanka@sltnet.lk

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No. 275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07


2011-09-07

මධ්‍ය නිවේදනය

**සෞඛ්‍ය අමාත්‍යවරයාගේ සහ රජයේ වෛද්‍ය නිළධාරීන්ගේ සංගමය අතර 06-09-2011 දිනැති සාකච්ඡාවේ තීරණ.**

මාලඹේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයේ ප්‍රමිතිය පිළිබඳ වාර්තාවක් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මඟින් ලබා දී නොමැති බවත් අවස්ථා ගණනාවකදී ප්‍රමිතිය පිළිපඳ මාලඹේ වෛද්‍ය විද්‍යාලයේ බළධාරීන්ට දැනුම් දී ඇති බවත් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ සභාපතිතුමිය අවධාරණය කරන ලදී. අවශ්‍ය ප්‍රමිති තත්ත්වයට ලඟා වන තුරු සිසුන් බඳවා නොගන්නා ලෙස දැනුම් දුන් බව එතුමිය ප්‍රකාශ කරන ලදී. තවද උසස් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද 1721/19 දරන ගැසට් ප්‍රත්‍රිකාව මඟින් උපාධි ප්‍රදානය කිරීමේ තත්ත්වය ලබා දුන්නද දැනට අන්තර්ග්‍රහනය කර සිටින සිසුන්ට කිසිසේත්ම මෙම ගැසට් පත්‍රය ප්‍රකාර උපාධි තත්ත්වය පිළිගත නොහැකි බවද එතුමිය අවධාරණය කරන ලදී.

මෙම ගැසට් පත්‍රය පැහැදිලි අඩුපාඩු විශාල සංඛ්‍යාවකින් සමන්විත වන බවත් අදාල වෛද්‍ය විද්‍යාලයේ ප්‍රමිතිය පිළිබඳ ගැටළු සහගත තත්ත්වයක් ඇති බවත් සෞඛ්‍ය අමාත්‍යවරයා අවධාරණය කරන ලදී. ප්‍රමිතියෙන් තොර කිසිඳු වෛද්‍ය විද්‍යාලයකට ඉඩ දිය නොහැකි බවත් එතුමා ප්‍රකාශ කරන ලදී. විශාල අඩුපාඩු සංඛ්‍යාවක් ඇති මෙම ආයතනයට උපාධි ප්‍රදාන තත්ත්වය ලබා දීමට කටයුතු කිරීම කිසිසේත් අනුමත කර නොහැකි බවත් , රුපියල් මිලියන 600ක මුදලක් රජයෙන් ලබා දීම වැනි දෑ ගැසට් පත්‍රයේ සඳහන් අසතුටුදායක බව සඳහන් කරන ලදී.

එළඹෙන ලද තීරණ,

- සෞඛ්‍ය අමාත්‍යංශය මඟින් පංච පුද්ගල කමිටුවක් පත් කර අදාල කැබිනට් පත්‍රිකාව පිළිබඳ වාර්තාවක් ලබාදීම සහ පුද්ගලික වෛද්‍ය විද්‍යාලයේ ප්‍රමිතිය පිළිබඳ වාර්තාවක් සැපයීම.

- අදාල කමිටු වාර්තාව ලබාදෙන තුරු මාලඹේ පුද්ගලික වෛද්‍ය විද්‍යාලයට සිසුන් ඇතුලත් කර නොගන්නා ලෙස ඉල්ලා සිටීම.

- වෛද්‍ය විද්‍යාල වල මූලික ප්‍රමිතිය, (Prescribe Standards) මාස 2ක් තුල නීති ගත කිරීමට කටයුතු කිරීම.

ස්තූතියි

වෛද්‍ය චන්ද්‍රික එපිටකඩුව
ලේකම්.

රජයේ වෛද්‍ය නිළධාරීන්ගේ සංගමය